# දැන්වීමයි

# සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතිය

## තනතුරු ඇබෑර්තු

සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2024-05-22 දින සිට 2024-06-14 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 1.2.2. වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

| තනතුර | වැටුප් පරිමාණ අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 102/5 III | 01 | මූලික වැටුප 19804, 320X10, 380X10, 450X10, 520X5, 33904 |

ඉහත මූලික වැටුපට අමතරව බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව අනුමත අනෙකුත් දීමනාද හිමි වේ.

02. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට සහ සේවක අර්ථසාධක, සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවා ගැනීමේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.

ගම්පහ දිස්ත්‍රික්කයේ ඕනෑම සමුපකාර සමිතියකින් ලබාගත හැකිය.

04. වයස් සීමාව - අවුරුදු 26 ත් 45 ත් අතර විය යුතුය. සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

06. ඉල්ලුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබා දී ඇති පත්වීම අවලංගු කළ හැකිය.

07. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරනු ලබන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයෙකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සලකා බලනු නොලැබේ.

08. අයදුම්පත් යොමු කිරීම.

I. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ '**සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම.**' යන්න සඳහන් කළ යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024-06-14 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකියාව ඇත. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ

**සභාපති,**
**සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අංක 380, මීගමුව පාර, වත්තල.**